විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 06/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. } ........................ | දිනය / திகதி / Date } 2022.10.05 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම කඩිනම් කිරීම**

2022.09.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 අනුව රාජ්‍ය නිලධාරීන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කර ඇත. ඒ අනුව 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාලය තුළ වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගැන්විය යුතු රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 12,000 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

02. විශ්‍රාම ගන්නා නිලධාරියෙකු වෙත විශ්‍රාම යන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යයයි. 2015.04.24 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2015 හි 6(II) වගන්තිය අනුව විශ්‍රාම වැටුප් අයදුම්පත් විශ්‍රාම ගන්වන දිනට මාස තුනකට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස දැනුම් දී ඇත.

03. ඒ අනුව විශ්‍රාම යන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ විශ්‍රාම යන දිනටම කාර්යක්ෂමව ලබා දිය හැකි වන පරිදි නිවැරදිව සම්පූර්ණ කරන ලද විශ්‍රාම වැටුප් අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ.ස. |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | කරු.දැ.ගැ.ස. |
| 3. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | කරු.දැ.ගැ.ස. |
| 4. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස. |
| 5. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස. |
| 6. | පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | - | කරු.දැ.ගැ.ස. |
| 7. | විගණකාධිපති | - | කරු.දැ.ගැ.ස. |


මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk